දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණයට අයත් කාර්යාල පිවිසුම් නිලධාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම - 2024

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති තාක්ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණයේ III ශ්‍රේණියේ කාර්යාල පිවිසුම් නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ආදායම් කොමසාරිස් ජනරාල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ - ''කාර්යාල පිවිසුම් නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2024'' යනුවෙන් සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් **2024.08.05 වැනි දිනට** හෝ එදිනට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ඇත. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු පිරවීම :-
පුරප්පාඩු වී ඇති කාර්යාල පිවිසුම් නිලධාරී තනතුරු ගණන එකකි.

04. වැටුප් පරිමාණය -
තනතුරට අදාළ වැටුප් ක්‍රමය - රු. 27,140 -10 x 300 - 11 x 350 -10 x 495 - 10 x 660 -රු. 45,540 (MN 1- 2016)

05. සුදුසුකම්

5.1 අධ්‍යාපන සුදුසුකම්

5.1.1. සිංහල/දෙමළ, භාෂාව ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවරක දී විෂයයන් හයකින් (6) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

5.1.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් :

5.2.1 තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් යතුරු ලියනය හා මූලික පරිගණක දැනුම පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.

5.2.2 ඉංග්‍රීසි හා සිංහල භාෂාවෙන් චතුර ලෙස කථා කිරීමේ හැකියාව තිබිය යුතුය. දෙමළ භාෂාව අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව නොවන්නේ

නම්, ඒ පිළිබඳව ව්‍යවහාර දැනුමක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5.3 *පළපුරුද්ද* :- අදාළ ක්ෂේත්‍රයේ වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

5.4 *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.5 *වෙනත් සුදුසුකම්* :-
i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5.6 වයස :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 (දහඅට) ට නොඅඩු අවුරුදු 30 (තිහ)ට නොවැඩි විය යුතුය. (අයදුම්පත් කැඳවන අවසන් දිනට)

06. බඳවා ගැනීමේ ක්‍රමය :

අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එම පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතාවය මත පවත්නා පුරප්පාඩුව අනුව කාර්යාල පිවිසුම් නිලධාරී තනතුරට බඳවා ගනු ලැබේ.

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
අතිරේක අධ්‍යාපන සුදුසුකම්	20	අදාළ නොවේ
අතිරේක වෘත්තීය සුදුසුකම්	25	
අතිරේක පළපුරුද්ද	25	
භාෂා හැකියාව	15	
පරිගණක හා තොරතුරු තාක්ෂණය පිළිබඳ හැකියාව	10	
සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාව	05	
එකතුව	100	

08. ව්‍යාජ තොරතුරු සැපයීම:-

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිර්ව්‍යාජ තොරතුරු සැපයිය යුතුය. සාවද්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක පත්වීම් බලධරයා විසින් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පුළුවන.

09. පත්වීමේ කොන්දේසි :

මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තේරී පත්වන අයදුම්කරු/අයදුම්කාරිය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය. විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු ය.

10. සේවා කොන්දේසි :
(අ) පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වනු ඇත.
(ආ) පත්වීම ලැබ වසර 03 ක් ඇතුලත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය. (ලිඛිත පරීක්ෂණයකි)
(ඇ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරනු ලබන පොදු කොන්දේසිවලටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST/3/1/2/3/2013 හා 2014.08.14 දිනැතිව අනුමත කරන ලද කාර්යාල පිවිසුම් නිලධාරී බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානයන්ට ද ඊට මින් මතු කරනු ලබන සංශෝධනයන්ට ද යටත්ව කාර්යාල පිවිසුම් නිලධාරී තනතුරට පත්වීම් ලබා දෙනු ලැබේ.

11. තෝරා ගැනීමේ පටිපාටිය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පවත්නා පුරප්පාඩු අනුව බඳවා ගනු ලැබේ.

12. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

භාෂාව	*ලබා ගත යුතු ප්‍රවීණතාව*
රාජ්‍ය භාෂාව	රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.
අනෙක් රාජ්‍ය භාෂාව	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

13. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත සැකසීම :
මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතියට අනුව අයදුම්පත සැකසිය යුතු අතර අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(සාමාන්‍ය ෆොටෝ කොපි 21 x 29 cm/8.5'' x 12''/A4) කඩදාසියේ දෙපැත්තම භාවිතා කරමින් අයදුම්පත සකස් කළ යුතුය.)

(ආ) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු නම් ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන, රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියෙකු කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස්වරයෙකු නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරීවරයෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක්, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කර ගත යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරනු ලබන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළු අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු නීති රීති සහ මෙම නිවේදනයේ අඩංගු කොන්දේසි අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

15. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

සටහන.- සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ඩබ්. ඒ. සේපාලිකා චන්ද්‍රසේකර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 07 වැනි දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යාල පිවිසුම් නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2024

1. පෞද්ගලික තොරතුරු
1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.)

1.2 අගට යෙදෙන නම් මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදාහරණ : GUNAWARDHANA H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.

3. ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

4. (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 1
අවිවාහක - 2

5. ජන වර්ගය - (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(සිංහල - 1, දෙමළ - 2, මුස්ලිම් - 3, වෙනත් - 4)

6. ජාතික හැඳුනුම්පත් අංකය :

7. උපන් දිනය :
වර්ෂය මාසය දිනය

8. සුදුසුකම් සැපිරිය යුතු අවසාන දිනට වයස :
(2024 .... දිනට)
අවුරුදු මාස දින

9. දුරකථන අංකය :

10. අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස. (සා. පෙළ)

(i) විභාගයේ වර්ෂය :————.

(ii) විභාග අංකය :————.

(iii) විභාග ප්‍රතිඵල :————.

විෂයය	ශ්‍රේණිය

අ.පො. ස. (උ. පෙළ)
(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :————.

විෂයය	ශ්‍රේණිය

11. වෘත්තීය සුදුසුකම් :...
....

....
....
....

12. පළපුරුද්ද :

....
....
....

13. ඔබ රජයේ සේවයේ තනතුරකින් විනයානුකූල හේතූන් මත පහකිරීමක් හෝ කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියේ වරදකරු වී ඇත්නම් හෝ ඒ හා සම්බන්ධ සියළුම විස්තර :

....
....

14. අයදුම්කරුගේ සහතිකය :

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ නිවැරදි ලෙස සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

(iii) අයදුම්පත සම්පූර්ණ කිරීමට හෝ අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සියලු කරුණු ඉතා හොඳින් කියවා අවබෝධ කරගත් බවත්, එහි සඳහන් සියලු කරුණු හා කොන්දේසිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී .... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුයි)

16. ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .... (සම්පූර්ණ නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ................සේවයේ .... ශ්‍රේණියේ ස්ථිර තනතුරක සේවය කරන බවත් ඔහු/ඇය මොනම ආකාරයක විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)